සමාජයේ ම කොටසක් වන ආබාධ සහිතව ජීවත් වන්නවුන් හැඳින්වීමේදී, ඔවුන්ගේ ගරුත්වය ආරක්ෂා වන, ඔවුන්ව කිසිම ලෙසකින් කොන් කිරීමකට ලක් නොවන භාෂාවක් මාධ්‍ය වාර්තා සඳහා ද අවශ්‍ය බව, Ethics Eye අපි, මින් පෙරද පෙන්වා දී ඇත්තෙමු. එහිදී ආබාධ සහිතව ජීවත් වන්නවුන්ගේ එම ආබාධයන් පුවතට අදාළ වන්නේ නම්, එම ආබාධ පිළිබඳව නිවැරදි දැනුමක් ලබා දීම අවශ්‍ය කරුණක් වේ. එසේම, ආබාධ සහිතව ජීවත් වන අය හැඳින්වීම සඳහා පෙරදී භාවිතා වූ ඇතැම් යල්පැනගිය යෙදීම් යෙදීම සම්පූර්ණයෙන්ම භාවිතයෙන් ඉවත් කිරීමද එලෙසින්ම අවශ්‍ය වේ.

අරුණ පුවත් වාර්තාවක (පෙබරවාරි 22, 2022) සිරස්තලයේ ලෙසින් යෙදී තිබූ, "අතුරුදන් වූ ගොළු කත බල්ලහැල රක්ෂිතයේ ගලක් උඩ සිට කෑ ගහලා" යන්න මෙහිදී උදාහරණ ලෙසින් දැක්විය හැක. මෙම පුවත් වාර්තාවේ අන්තර්ගතය තුළ දැක්වෙන්නේ, ඇය "කථා කිරීමට අපහසු කාන්තාවක්" බවයි.

1) එසේ නම්, එය, සිරස්තලයේ "ගොළු" යනුවෙන් දැක්වෙන සම්පූර්ණයෙන්ම කථන හැකියාව නොමැති වීමට වඩා වෙනස් තත්ත්වයක් නොවේද? ඒ අනුව, මෙම පුවත් සිරස්තලය හා අන්තර්ගතය ඔස්සේ, කථනාබාධයක් සම්බන්ධයෙන් නිවැරදි නොවන තොරතුරු ඉදිරිපත් වී නොමැතිද?

2) මෙම සිරස්තලයේ එන "ගොළු කත" වැනි යෙදුම්, යල් පැනගිය, සමාජ කොන් කිරීම් ඇති කරවන ආකාරයේ යෙදුම් නොවේද? ඒ වෙනුවට වඩාත් යෝග්‍ය වන්නේ 'කථනාබාධ සහිත කත' නැතිනම් 'කතා කිරීමට අපහසු කත' වැනි යෙදුමක් නොවන්නේද?


මූලාශ්‍ර: http://www.disability.wa.gov.au/.../words_that_work_media...

https://ncdj.org/style-guide/ https://www.aucd.org/docs/add/sa_summits/Language%20Doc.pdf

https://www.who.int/.../fact.../detail/disability-and-health